IHRA
UNIVERSITY OF COLOMBO

**මානව සම්පත් අභිවර්ධන ආයතනය**
**කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව**

**ශ්‍රම අධ්‍යාපන ඩිප්ලෝමා පරීක්ෂණය - 2014**
**ප්‍රථම සෙමෙස්තරය**
**(පවත්වන ලද්දේ 2015 නොවැම්බර්)**

# DY 03 – ආර්ථික විද්‍යාව

**විභාග අපේක්ෂකයින්ට උපදෙස් :**

(1) පහත දක්වා ඇති උපදෙස් පිළිපදිමින් ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.

(2) කාලය පැ. තුනයි. (03)

(3) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න පහකින් (05) සහ පිටු එකකින් (01) සමන්විතවේ.

(4) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(5) විභාගය අවසානයේදී සියලුම පිළිතුරු පත්‍ර එකට ගැට ගැසිය යුතුය.

(6) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණයවී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

(01) (i) "ගෝලීයකරණයෙන් අධි තරඟකාරීත්වයට ලක්වූ ව්‍යාපාරික ලෝකයේ සංකීර්ණත්වය හේතුවෙන් පුද්ගලයන්ගේ වුවමනාවන්ද වර්තමානයේදී සංකීර්ණ වී පවතී". ඉහත ප්‍රකාශය 'සාපේක්ෂ හිඟකම' නැමැති ආර්ථික සංකල්පය ඇසුරෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(ii) "භාණ්ඩ නිෂ්පාදනයේදී මෙන් නොව සේවා සැපයීමේදීද, සේවා සපයන්නා හට විවිධ අභියෝගයන්ට මුහුණ දීමට සිදුවේ".
සේවාවන්හි විශේෂ ලක්ෂණයන් හුවා දක්වමින් ඉහත ප්‍රකාශය පැහැදිලි කරන්න.

(ලකුණු 15)
(මුළු ලකුණු 25)

(02) "නූතන තාක්ෂණයේ දියුණුව, ව්‍යාපාරික පරිසරය පුළුල් කිරීමටත්, එහි තරඟකාරීත්වය දැඩි කිරීමටත් ඉවහල් වන අතර, මේ හේතුවෙන් බොහෝ ආර්ථිකයන් වර්තමානයේදී සමාජවාදී ආර්ථිකයන් කෙරෙහි නැඹුරුවීමේ ප්‍රවණතාවයක් පවතින බව ඇතැම් සමාජ විද්‍යාඥයන්ගේ මෙන්ම ආර්ථික විද්‍යාඥයන්ගේද මතයයි".
ඉහත ප්‍රකාශය විවේචනාත්මකව පැහැදිලි කරන්න.

(ලකුණු 25)

(03)

(i) 'ඉල්ලුම' හා 'සැපයුම' නිර්වචනය කරන්න.

(ලකුණු 05)

(ii) 'තේ' සඳහා ඇති ඉල්ලුමට හා සැපයුමට තීරණය කිරීමට බලපාන සාධකයන් 5 බැගින් දක්වන්න.

(ලකුණු 10)

(iii) 'වෙළඳපල සමතුලිතය' යන සංකල්පය සුදුසු ලේඛන හා ප්‍රස්ථාර සටහන් යොදා ගනිමින් විස්තර කරන්න.

(ලකුණු 10)
(මුළු ලකුණු 25)

(04)

(i) නිෂ්පාදන සාධකයන් ලෙස ශ්‍රමය, ව්‍යවසායකත්වයෙන් වෙනස් වන ආකාරය දක්වන්න.

(ලකුණු 05)

(ii) භූමියෙහි විශේෂ ලක්ෂණයන් දක්වා, එය ප්‍රාග්ධනයෙන් වෙනස් වන ආකාරය දක්වන්න.

(ලකුණු 05)

(iii) 'නිෂ්පාදන සම්පත් සීමා සහිත වුවද තාක්ෂණයේ දියුණුව නිසා නිෂ්පාදන සම්පත් වල ඵලදායීතාවය වර්ධනය කරගැනීමට හැකිවී තිබේ'. ඉහත ප්‍රකාශය උදාහරණ ඇසුරින් සාකච්ඡා කරන්න.

(ලකුණු 15)
(මුළු ලකුණු 25)

(05) කෙටි සටහන් ලියන්න.

(i) වැඩෙන ආවස්ථික පිරිවැය හා ස්ථාවර ආවස්ථික පිරිවැය
(ii) ආර්ථික භාණ්ඩ හා නිදහස් භාණ්ඩ
(iii) පූර්ණ සුභසාධන භාණ්ඩ හා අර්ධ සුභසාධන භාණ්ඩ
(iv) නිෂ්පාදන හැකියා මායිම් වක්‍ර සහ හිඟකම
(v) කුටුම්භ අංශය හා ව්‍යාපාරික අංශය

(ලකුණු 5 x 5 = 25)